Uva Wellassa University

# ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය
# ශිෂ්‍ය ප්‍රවේශය
# අධ්‍යයන වර්ෂ - 2020/2021

## අභියෝගයතා පරීක්ෂණය

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිකුත් කර ඇති " 2020/2021 අධ්‍යයන වර්ෂය සඳහා ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රථම උපාධි පාඨමාලා සඳහා ප්‍රවේශය'' පිළිබඳ වූ අත්පොතෙහි 1.2 වගන්තියට අනුව සුදුසුකම් ඇති අපේක්ෂකයින්ගෙන් ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ පහත සඳහන් උපාධි පාඨමාලා වලට ඇතුළත්වීම සඳහා අභියෝගයතා පරීක්ෂණය සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

- පරිගණක විද්‍යාව සහ තාක්ෂණය
- කාර්මික තොරතුරු තාක්ෂණය
- ව්‍යවසායකත්වය සහ කළමණාකරණය
- ආගන්තුක සත්කාර, සංචාරක ව්‍යාපාර සහ සිද්ධි පිළිබඳ කළමණාකරණය

ඉල්ලුම් කරන ලද වැඩසටහනට අදාළ අපේක්ෂකයින්ගේ යෝග්‍යතාවය පරීක්ෂා කිරීම සඳහා මෙම පරීක්ෂණය ඉංග්‍රීසි මාධ්‍යයෙන් පවත්වනු ලැබේ.

එක් එක් උපාධි පාඨමාලාව සඳහා අයදුම් කිරීමට අවශ්‍ය අවම සුදුසුකම් ඉහත සඳහන් අත්පොතෙහි 2.2.8.15, 2.2.8.16, 2.2.8.18 සහ 2.2.8.21 වගන්තිවල සඳහන් වේ.

අභියෝගයතා පරීක්ෂණය සඳහා වන අයදුම් පත්‍රය 2021 ජුනි 23 දින හෝ ඊට පෙර ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ වෙබ් අඩවිය (www.uwu.ac.lk) හරහා මාර්ගගතව ඉදිරිපත් කරන ලෙස අයදුම්කරුවන්ගෙන් ඉල්ලා සිටින අතර සබැඳි අයදුම්පත සමඟ පහත ලිපි ලේඛන උඩුගත කළ යුතුය.

i. එක් විභාග ප්‍රශ්න පත්‍රයක් සඳහා රු 500/- බැගින් ලංකා බැංකුවේ ඕනෑම ශාඛාවකින් ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ ගිණුම් අංක 78166821, ලංකා බැංකුව, බදුල්ල ශාඛාවට බැර කරන ලද බැංකු රිසිට් පතෙහි ස්කෑන්කල කළ පිටපතක් (කරුණාකර මෙම රිසිට්පතේ ඡායා පිටපතක් ඔබ ළඟ තබා ගන්න). මෙම ගාස්තුව නැවත ගෙවනු නොලැබේ. [උදා: ඔබ විෂයයන් දෙකක් සඳහා පෙනී සිටීමට කැමති නම්, ගාස්තුව රු 1000/- (2 x රු 500/- ) වනු ඇත]

අභියෝගයතා පරීක්ෂණය පවත්වනු ලබන දිනය පසුව දැනුම් දෙනු ලබන අතර සුදුසුකම් ලත් අයදුම්කරුවන්ට ප්‍රවේශ පත්‍ර විද්‍යුත් මාර්ගයෙන් යවනු ලැබේ.

සියලුම විභාග ප්‍රශ්න පත්‍ර සඳහා එක් අයදුම්පත්‍රයකින් අදාළ විභාග ගාස්තු සහිතව අයදුම් කරන ලෙස අපේක්ෂකයින්ට උපදෙස් දෙනු ලැබේ.

විභාගය සඳහා ගෙවන ලද මුදල අයදුම් කරන ලද විභාග ප්‍රශ්න පත්‍ර සංඛ්‍යාවට වඩා අඩු නම්, අපේක්ෂකයා දක්වා ඇති කැමැත්තෙහි අනුපිළිවෙල අනුව ලබා දිය හැකි ප්‍රශ්න පත්‍ර සංඛ්‍යාව පමණක් සලකා බලනු ලැබේ. අභියෝගයතා පරීක්ෂණය පවත්වනු ලබන මධ්‍යස්ථාන සහ ඊට අදාළ මධ්‍යස්ථාන අංකයන් පහත සඳහන් කර ඇත. කරුණාකර ඔබට වඩාත් පහසු මධ්‍යස්ථානය තෝරන්න.

| මධ්‍යස්ථානය | මධ්‍යස්ථාන අංකය |
|---|---|
| කොළඹ | 01 |
| යාපනය | 02 |
| නුවර | 03 |
| මාතර | 04 |
| බදුල්ල | 05 |
| අනුරාධපුර | 06 |
| මඩකලපුව | 07 |

ඔබ අයදුම් කරන විභාග මධ්‍යස්ථානය ඔබවෙත ලබාදීමට නොහැකි විට ඒ සඳහා සුදුසු වෙනත් විභාග මධ්‍යස්ථානයක් ලබාදෙනු ලැබේ.

**ලේඛකාධිකාරී**
**ඌව වෙල්ලස්ස විශ්ව විද්‍යාලය**
**පස්සර පාර බදුල්ල**
**23.05.2021**

දුරකථන අංක 055-2226622
ෆැක්ස් 055-2226633
වෙබ් අඩවිය www.uwu.ac.lk